**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 0I, - 2017**

---

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ - අදියර 0I, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල් - පී110 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති ලියවිල්ලේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අනුරාධපුර උතුර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩිකිරීම සහ එමඟින් ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයන් හා සෞඛ්‍ය තත්ත්වයන් වර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,515 කට සමාන ජපන් යෙන් මිලියන 6,817 ක් වූ අතර රු.මිලියන 8,726 කට සමාන ජපන් යෙන් මිලියන 5,166 ක් මූල්‍යායනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර 2018 පෙබරවාරි වන විට නිම කිරීමට නියමිත විය. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2020 අප්‍රේල් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ

තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.	මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1	මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ)	2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ)	සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ)	ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ)	මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඉ)	ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**-----------------------------------------**

**2.2.1	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 සැප්තැම්බර් 10 දිනදීය.

**2.2.2	ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ)	එකතුව රු.මිලියන 20.19 ක් වූ ගෙවන ලද එකතු කළ අගය මත බදු කෙරීගෙන යන වැඩ වටිනාකම යටතේ දැක්වීම වෙනුවට ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයට එරෙහිව හිලව් කර තිබුණි.

(ආ)	1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපෘතියේ වසර 5 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණු කාර්යය මණ්ඩල සාමාජිකයින් සඳහා 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂික ප්‍රතිපාදන සළසා නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දක්වා | |
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 5,166 | 8,726 | 237.21 | 166.89 | 226.90 | 536.35 | 673.34 |
| ශ්‍රී ලං ර | 1,651 | 2,789 | 62.05 | 46.16 | 62.76 | 181.94 | 227.24 |
| එකතුව | 6,817 | 11,515 | 299.26 | 213.05 | 289.66 | 718.29 | 900.58 |

ඉහත තොරතුරු අනුව, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන් නිසා, ව්‍යාපෘති කටයුතු ආරම්භ කර අවුරුදු 04 යි මාස 10 ක් ගතවීමෙන් පසුවත් ණය මුදල් සපයන නියෝජිතායතනය විසින් සපයන ලද ජපන් යෙන් මිලියන 5,166 කට සමාන රු. මිලියන 8,726 ක මුළු වෙන්කිරීමෙන් සියයට 7.71 ක් නියෝජනය වන ජපන් යෙන් මිලියන 536.35 කට සමාන රු.මිලියන 673.34 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති කාර්යයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 12.23 ක් හා සියයට 8.66 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. තවද, 2018 ඔක්තෝබර් 30 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතියේ පිළිවෙලින් සියයට 19.87 ක හා සියයට 21.97 ක ආන්තික වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජලය ඇතුල්වන මාර්ග පහසුකම් වැඩි දියුණු කිරීම, ජලපවිත්‍රාගාරය, වතුර එක්රැස් වන ස්ථාන, සෝපාන ටැංකි, කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම සහ අනෙකුත් යාන්ත්‍රික හා විදුලි වැඩ ආදී කාර්යයන් 2018 පෙබරවාරි වනවිට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද සැලසුම් සහ ලංසු ලියවිලි සකස් කිරීමේ සහ ඒ පිළිබඳ ඇගයීම, ලංසු ඇගයීම සඳහා කල් ගැනීම සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම ආදියෙහි ප්‍රමාදය නිසා ඒ සම්බන්ධයෙන් වූ

කොන්ත්‍රාත් 2018 මාර්තු 23 දින පිරිනමා තිබුණි. කාලීනව වැඩ අවසන් කිරීමට ප්‍රමාණවත් කම්කරු පිරිසක් කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවා නොතිබුණු බව ව්‍යාපෘතියේ දෛනික ප්‍රගති වාර්තාවලට සහ කොන්ත්‍රාත් වැඩබිම්වල සිදුකළ වාරක විගණන පරීක්ෂණවලට අනුව අනාවරණය විය. තවද, ඉඩම් අත්කර ගැනීමේ ආරාවුල් නිසා වතුර ටැංකිය, පහත ජලාශය සහ නිල නිවාස ආදී ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩ 2018 දෙසැම්බර් 31 දින වනවිටද ආරම්භකර නොතිබුණි.

(ආ) මැදවච්චිය හා රඹෑව ප්‍රදේශවල පිහිටි ප්‍රධාන සම්ප්‍රේෂණ සහ ප්‍රධාන බෙදාහැරීමේ මධ්‍යස්ථාන වල 'High Density Poly Ehilene' නල සහ 'Ductile' යකඩ නල සැපයීම සහ එළීම සඳහා වූ කොන්ත්‍රාත්තුව ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කළ දිනයේ සිට වසර 04 යි මාස 09 ක් ඉකුත්වීමෙන් පසු 2017 නොවැම්බර් මස ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවත්, 2019 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට නියමිතව ඇති මීටර් 252,353 ක් වූ අදාල නල එළීමේ කටයුතු වලින් මීටර 4,627.18 ක නල එළීමේ කටයුතු පමණක් 2018 සැප්තැම්බර් 30 දින වන විට අවසන් කර තිබුණි.

(ඇ) ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කළ දිනයේ සිට වසර 03 යි මාස 09 ක් ඉකුත් වීමෙන් පසු එනම් 2016 ඔක්තෝබර් මස ඉසින්බැස්සගල ප්‍රදේශයේ 'Ductile' යකඩ නල සහ ' Galvanized' යකඩ නල සැපයීම සහ එළීම සහ 'Up Plasticized Poly Vinyl' නල එළීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2016 ඔක්තෝබර් මස ප්‍රදානය කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවත්, 2018 සැප්තැම්බර් 30 දින අවසන් කිරීමට නියමිත මීටර් 112,311 ක් වූ නල එළීමේ වැඩකටයුතු වලින් 2018 සැප්තැම්බර් 30 දිනට මීටර් 101,073.46 ක වැඩ පමණක් අවසන් කර තිබුණි.

**3.4 බාහිර ක්‍රියාකාරකම්**

------------------------

2014 වර්ෂයේදී රු. මිලියන 129.05 ක පිරිවැය වූ වතුර බවුසර් 11 ක්, මෝටර් කාර් 02 ක් සහ මෝටර් සයිකල් 02 ක් ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කර තිබුණු අතර ඉන් එක් වතුර බවුසරයක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලයට භාරදී තිබුණු අතර මෝටර් කාර් හා මෝටර් බයිසිකල් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ අනුරාධපුර ප්‍රාදේශීය ආධාර සේවා කාර්යාලයට භාරදී තිබුණි. කෙසේ වුවත්, ව්‍යාපෘතිය විසින් ප්‍රවාහන සේවාවන් පිටතින් ලබාගැනීමට පියවර ගෙන තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 12.46 ක් ඒ සඳහා වැය කර තිබුණි.

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ අනුමත කාර්ය මණ්ඩලය තනතුරු 42 කින් සමන්විත නමුත් සිවිල් සහ යාන්ත්‍රික ඉන්ජිනේරුවන් 04 ක්, ඉන්ජිනේරු සහායකයින් 04 ක් සහ ව්‍යාපෘති ගණකාධිකාරීවරයෙක් ඇතුලු තනතුරු 17 ක් 2018 ඔක්තෝබර් 30 දිනට වසර 05 කට අධික කාලයක සිට පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 අගෝස්තු 07 දින ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුමේ 15 ඡේදය ප්‍රකාරව, මහකනදරා වැවේ ප්‍රධාන හා උප පද්ධති ප්‍රතිසංස්කරණ වැඩකටයුතු කරගෙන යාමට ශ්‍රී ලංකා රජය මගින් ලැබුණු දායකත්වයෙන් රු. මිලියන 300 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවීමට එකගවී තිබුණි. කෙසේ වුවත්, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් එය ප්‍රේෂණය කිරීමට සහ අදාල වැඩ නිමකිරීමට 2018 ඔක්තෝබර් 30 දින වන විටද කටයුතු කර නොතිබුණි.